**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2016 ඔක්තෝබර් 27 ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධාන 2016 අංක 04**

# අවම ද්‍රවශීල වත්කම් අනුපාතිකයක් පවත්වා ගැනීම

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 11 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. අවම ද්‍රවශීල වත්කම් අනුපාතිකය

1.1. සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම සෑම විටම ද්‍රවශීල වත්කම්වල එකතුවේ සාමාන්‍යය මාසික මුළු තැන්පතු වගකීම්වල එකතුවෙන් සියයට පහළොවකට (15%) නොඅඩු විය යුතුය.

1.2. ද්‍රවශීල වත්කම් අනුපාතිකය (ද්‍ර.ව.අ.) ගණනය කිරීම පහත සඳහන් සූත්‍රය පදනම් කරගෙන කළයුතුය. ද්‍රවශීල වත්කම් අනුපාතිකය ගණනය කිරීම සවිස්තරව ඇමුණුමෙහි දක්වා ඇත.

---

2. මුළු සාමාන්‍ය ද්‍රවශීල වත්කම් එකතුව

2.1 සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම පවත්වා ගනු ලබන කාලය සඳහා පහත වත්කම්හි දෛනික සාමාන්‍යය එකතු කිරීමෙන් මුළු සාමාන්‍ය ද්‍රවශීල වත්කම් ගණනය කළ යුතුය.

අ) අතැති මුදල්

ආ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුමෙහි ශේෂය

ඇ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් වාණිජ බැංකුවල ඇති තැන්පතු ගිණුමෙහි ශේෂය

ඈ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් විශේෂිත බැංකුවල පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුමෙහි ශේෂය

ඉ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත්

ඊ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බැඳුම්කර

|  |  |  |  |
|---|---|---|---|
|  |  |  | ඞ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම්පත් |
|  |  |  | ඞෟ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් |
|  |  |  | එ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම්ගත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර |
| 3. | අධීක්ෂණ මැදිහත්වීම් සහ අවම අවශ්‍යතාවයන් තහවුරු කරගැනීමේ පියවර | 3.1. | බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක ද්‍රවශීලතාවය, පවත්වා ගත යුතු අවම අවශ්‍යතාවයට වඩා අඩුවීම වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ක්ෂණිකව මැදිහත් වනු ඇත. |
|  |  | 3.2. | බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විධාන 1 හි පරිදි අවම ද්‍රවශීල අවශ්‍යතාවය පවත්වා ගැනීමට අපොහොසත් වුවහොත් එම අවම අවශ්‍යතාවය සපුරන තෙක් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ බව ස්ථිර කරන තෙක්, එම සමාගම විසින් එක් දිනකට ද්‍රවශීලතා හිඟයෙහි වටිනාකමින් සියයට දශම එකක් (0.1%) හෝ රුපියල් විසිපන්දහසක් (රු25,000/-) යන දෙකෙන් අඩු මුදල ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය. |
| 5. | නියාමන වාර්තා කිරීම | 5.1. | සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම මේ සමග ඇති වාර්තා කිරීමේ ආකෘතිය උපායෝගී කරගනිමින් මාසිකව, සෑම මසක්ම අවසාන වී ඊළඟ දින 15 ක් ඇතුලත ද්‍රවශීල වත්කම් අනුපාතිකය පිළිබඳ වාර්තාවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. |

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ඇමුණුම

.............................................................................................................................................. වෙතින්

අධ්‍යක්ෂ, ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත

## ද්‍රවශීල වත්කම් අනුපාතිකය

| | රු '000 |
|---|---|
| 1. ...................... මාසයේ අවසාන වැඩ කරන දිනට මුලු තැන්පතු (පදනම් දිනය) | ......................... |
| 2. ............................. මාසය සඳහා වන ද්‍රවශීල වත්කම් වල සාමාන්‍යය. (පවත්වාගනු ලබන කාලය) | ......................... |
| අ) අතැති මුදල් | ......................... |
| ආ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුමෙහි ශේෂය | ......................... |
| ඇ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් වාණිජ බැංකුවල ඇති තැන්පතු ගිණුමෙහි ශේෂය | ......................... |
| ඈ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් විශේෂිත බැංකුවල පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුමෙහි ශේෂය | ......................... |
| ඉ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් | ......................... |
| ඊ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බැඳුම්කර | ...................... |
| උ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම්පත් | .......................... |
| ඌ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් | ......................... |
| එ) යම් බැංකුකරුවෙකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම්ගත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | ........................ |
| 3. ද්‍රවශීල වත්කම් අනුපාතය (2,1 හි ප්‍රතිශතයක් ලෙස) | ......................... |

අපි/මම, ඉහත වාර්තාව නිවැරදි බවටත් සමාගමේ ලේඛන වලට අනුකූල බවටත් මෙයින් සහතික කරමි/ කරමු.

දිනය :……………………  ..........................................................................

බලයලත් නිලධාරීගේ අත්සන

සටහන: පදනම් දිනය පසුගිය මාසයේ අවසන් වැඩ කරන දිනයයි. උදා : අප්‍රියෙල් මාසය සඳහා ද්‍රවශීල වත්කම් ගණනය කරනු ලබන්නේ මාර්තු මාසය අවසානයේ තැන්පතු වගකීම පදනම් කරගෙනය. ද්‍රවශීල වත්කම් පවත්වා ගත යුතු කාලය (පවත්වාගනු ලබන කාලය) පදනම් දිනයෙන් පසුව එන දින දර්ශන මාසයේ පළමු වන වැඩ කරන දිනයෙන් පටන් ගෙන එම මස අවසාන දිනය දක්වා වේ.